සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 7 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

Mathematics

ගණිතය

Name :- .... Grade : -................ Index number:-....................

I කොටස

- **සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලැබේ.**

1. සුළු කරන්න. $5\frac{2}{5} + 3\frac{1}{5}$

2. අගය සොයන්න. (i) $56.75 \div 1000 =$

   (ii) $0.765 \times 100 =$

3. දී ඇති සංඛ්‍යා රේඛාව භාවිතයෙන් (-4) + (-2) හි අගය සොයන්න.



4. 16, 2 හි බලයක් ලෙස ලියා දක්වන්න.

5. $x \times x \times x \times y \times y$ ප්‍රකාශනය දර්ශක ආකාරයෙන් ලියා දක්වන්න.

6. කිරි පිටි පැකට්ටුවක ස්කන්ධය 0.4 kg වේ. එවැනි පැකට් 6 ක මුළු ස්කන්ධය සොයන්න.

7. < හෝ > හෝ යන සංකේත යොදා හිස්තැන් පුරවන්න.

$\frac{1}{2}$ …….. $\frac{3}{5}$

8. කිරි 7l 200ml බෝතල් 4 කට සමාන ප්‍රමාණ වලින් දමන ලදී. එක් බෝතලයකට දමන ලද කිරි ප්‍රමාණය කොපමණ ද?

9. ක්‍රි. ව. 1900 අධික අවුරුද්දක් වේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

10. පොතක දිග හා පළල පිළිවෙලින් 25cm සහ 18cm 3mm වේ. එහි පළලට වඩා දිග කොපමණ වැඩිද?



11. ගැළපෙන පිළිතුරු යටින් ඉරි අඳින්න.
මෙම රූපයෙන් දැක්වෙන්නේ (උත්තල/අවතල) සවිධි (පංචාස්‍රයකි/ෂඩාස්‍රයකි)



12. a = 2 සහ b = 5 නම් a + 3b ප්‍රකාශනයේ අගය සොයන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

13. සමචතුරස්‍රාකාර හැඩැති පන්ති කාමරයක පරිමිතිය 40cm වේ. එහි වර්ගඵලය සොයන්න.

14. රූපයේ පරිමිතිය සඳහා විජීය ප්‍රකාශනයක් ලියන්න.



15. පැන්සලක මිල පෑනක මිලට වඩා රු. x ප්‍රමාණයක් අඩුය. පෑනක මිල රු. p නම් පැන්සල් 3ක් මිල සඳහා විජීය ප්‍රකාශනයක් ලියා දක්වන්න.

16. අගය සොයන්න.

(i) $12 + 4 \div 2 =$

(ii) $45 - 15 \times 3 =$

17. 4897 යන සංඛ්‍යාව 3න් බෙදේ ද? හේතු දක්වන්න.

18. P = {20ට අඩු ප්‍රථමික සංඛ්‍යා}

P කුලකයේ අවයව වෙන් රූප සටහනක දක්වා එහි අවයව සංඛ්‍යාව ද ලියන්න.

19. හිස් කොටු සම්පූර්ණ කරන්න.

(i) $(-5) + (-8\frac{1}{2}) = \square$

(ii) $(+3.5) + (-0.6) = \square$

20. සීනු 3ක් පිළිවෙළින් මිනිත්තු 18කට, මිනිත්තු 24කට සහ මිනිත්තු 36කට වරක් නාද වේ. මුල්වරට සීනු 3 ම පෙ. ව. 8.00 නාද වූයේ නම් නැවත එකවර නාද කරන වේලාව සොයන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01. ඔබ ඉගෙන ගත් වෘත්ත පාඩමට අදාළව කරන ලද ක්‍රියාකාරකම් සිහිපත් කර ගන්න.

a) වෘත්ත ඇඳීම සඳහා භාවිතා කරන ගණිත උපකරණ කට්ටලයේ ඇති උපකරණය නම් කරන්න.

b) පහත වෘත්තාකාර රූපයේ AD යනු වෘත්තය සමාන කොටස් දෙකකට බෙදන ලද සරල රේඛාවකි. මෙම රූපය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) වෘත්තයේ කේන්ද්‍රය නම් කරන්න.

(ii) අරයයන් දෙකක් ලියන්න.

(iii) විෂ්කම්භය නම් කරන්න.

(iv) BO හා AD අතර ඇති සම්බන්ධතාව ලියන්න.

(c) අරය 3.5cm වන වෘත්තයක් අඳින්න.

(d) පහත රූපය ඇසුරින් දී ඇති වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරගෙන හිස්තැන් පුරවන්න.



ත්‍රිකෝණ වර්ගය	ත්‍රිකෝණයේ නම
1. සමපාද ත්‍රිකෝණයක්	
2. සමද්විපාද ත්‍රිකෝණයක්	
3. විෂම පාද ත්‍රිකෝණයක්	
4. සෘජු කෝණී ත්‍රිකෝණයක්	
5. සුළු කෝණී ත්‍රිකෝණයක්	
6. මහා කෝණී ත්‍රිකෝණයක්	

02. a) රූපයේ දැක්වෙන බෝතලයේ ඇති ජල ප්‍රමාණය



(i) මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලීටර් වලින් දක්වන්න.

(ii) එම මිශ්‍ර සංඛ්‍යාව විෂම භාගයක් ලෙස ලියා දක්වන්න.

(iii) ජල ප්‍රමාණය මිලිලීටර් වලින් කොපමණ වේද?

b) භාජනයක කිරි 4l 200ml ක් ඇත. එම භාජනයෙන් 1l 650ml සහ 800ml බැගින් දෙදෙනෙකුට විකුණන ලදි.

(i) විකුණන ලද මුළු කිරි ප්‍රමාණය ලීටර් හා මිලිලීටර් වලින් ලියා දක්වන්න.

(ii) ඉතිරි කිරි ප්‍රමාණය කොපමණද?

c) එළවළු කොටුවක $\frac{2}{5}$ ක ප්‍රමාණයක් තක්කාලි ද, $\frac{3}{8}$ ක ප්‍රමාණයක් මිරිස් ද වගා කර ඇත. තක්කාලි හා මිරිස් වගා කරන ලද බිම් ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න.

03. a) (i) සිතුමිණි තම සුරතල් පූසාගේ ස්කන්ධය සොයා ගැනීමට අනුගමනය කළ ක්‍රියා පිළිවෙළින් ලද පාඨාංක මෙසේය.

- පූසා සමග සිතුමිණිගේ ස්කන්ධය = 30kg 450g
- පූසා නොමැතිව සිතුමිණිගේ ස්කන්ධය = 28kg 700g

එමගින් පූසාගේ ස්කන්ධය සොයන්න.

(ii) බිස්කට් පෙට්ටියක බර 2kg 500g වේ. එවැනි පෙට්ටි 10ක බර සොයන්න.

(iii) සහල් 2kg 750g ක් සහ සීනි 1kg 500g ක් ස්කන්ධය 85g ක් වන මල්ලකට දමන ලදී. මල්ල සමග සහල් හා සීනි වල මුළු ස්කන්ධය සොයන්න.

b) අගය සොයන්න.

(i) $3\frac{1}{8} + 4\frac{2}{3}$

(ii) $16\frac{2}{5} - 11\frac{1}{3}$

04. a) සෘජු කෝණාස්‍රයක දිග සෙන්ටිමීටර් x වේ. එහි පළල දිගට වඩා 5cmකින් අඩු වේ. එහි පරිමිතිය P ලෙස ගත් විට

(i) එහි පළල x ඇසුරෙන් ලියන්න.

(ii) එහි පරිමිතිය P සඳහා සූත්‍රයක් x ඇසුරෙන් ගොඩ නගන්න.

(iii) එම සූත්‍රය හැකිතාක් සුළු කරන්න.

(iv) x = 12cm නම් සෘජුකෝණාස්‍රයේ පරිමිතිය වන P හි අගය සොයන්න.

b) (i) පහත සමීකරණය විසඳන්න.

$5a - 4 = 51$

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(ii) පහත ගැලීම් සටහනේ හිස් කොටු සම්පූර්ණ කරන්න.



$x = 6$

05. a) (i) පැත්තක දිග 6cm වන ඝනකයක පරිමාව සොයන්න.

(ii) රූපයේ පරිදි දිග, පළල සහ උස පිළිවෙළින් 12cm, 5cm හා 4cm වන ඝනකාභ හැඩැති භාජනයක පරිමාව සොයන්න.



b) රූප සටහනේ දැක්වෙන පරිදි ABCD ඍජුකෝණාස්‍ර ඉඩමේ AB දිග 60m සහ AD පළල 40m වේ. ඉඩමේ දෙපැත්තකට මායිම් වන ලෙස 5m පළල පාරක් ඇත.



(i) ඍජුකෝණාස්‍රාකාර ඉඩමේ වර්ගඵලය සොයන්න.

(ii) පාරේ වර්ගඵලය සොයන්න.

06. a) (i) PQ සරල රේඛා ඛණ්ඩයක් අඳින්න. එයට 4cm දුරින් PQ ට සමාන්තර රේඛාවක් අඳින්න.

(ii) එවැනි සමාන්තර රේඛා කීයක් ඇඳිය හැකිද?

b) (i) 7cm දිග AB සරල රේඛා ඛණ්ඩයක් අඳින්න.

(ii) $B\hat{A}D = 60^\circ$ වන සේ සහ AD = 5cm වන ලෙස AD රේඛාව අඳින්න.

(iii) AB ට සමාන්තරව D හරහා රේඛාවක් අඳින්න.

(iv) AD ට සමාන්තරව B හරහා රේඛාවක් අඳින්න. එම රේඛා දෙක හමුවන ලක්ෂ්‍යය C ලෙස නම් කරන්න.

(v) ඔබට ලැබෙන රූපය කුමන රූපයක් දැයි නම් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

07. (i) $15\frac{1}{2}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(ii) 0.25 භාගයක් ලෙස දක්වන්න.

(iii) 3.45×7 අගය සොයන්න.

(iv) $88.5 \div 5$ අගය සොයන්න.

(v) ගවුමකට මෝස්තරයක් දැමීම සඳහා 1.65m ක රේන්ද ප්‍රමාණයක් අවශ්‍ය වේ. එවැනි ගවුම් 12ක් මැසීම සඳහා අවශ්‍ය රේන්ද ප්‍රමාණය මීටර් කොපමණද?